අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

ආර්ථික විද්‍යාව - I පත්‍රය

පිළිතුරු සඳහා මඟ පෙන්වීම

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
(1)	4	(26)	5
(2)	3	(27)	4
(3)	1	(28)	5
(4)	4	(29)	2
(5)	4	(30)	3
(6)	1	(31)	5
(7)	3	(32)	3
(8)	1	(33)	4
(9)	2	(34)	4
(10)	2	(35)	1
(11)	4	(36)	4
(12)	1	(37)	5
(13)	4	(38)	3
(14)	4	(39)	4
(15)	1	(40)	4
(16)	4	(41)	4
(17)	3	(42)	3
(18)	2	(43)	1
(19)	3	(44)	4
(20)	2	(45)	3
(21)	4	(46)	2
(22)	2	(47)	4
(23)	3	(48)	1
(24)	1	(49)	2
(25)	1	(50)	5

(ලකුණු 02 බැගින් මුළු ලකුණු 100යි)

The National e-learning Portal for The General Education

ආර්ථික විද්‍යාව - II පත්‍රය

පිළිතුරු සඳහා මඟ පෙන්වීම

1. (i) ⋆ ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත් - නිෂ්පාදන ක්‍රියාවලියට උපයොජනය කරන විට අවසන් වන නමුත් ප්‍රතිජනනය වන සම්පත්
උදා: වනාන්තර, ධීවර සම්පත්

⋆ ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් - නිෂ්පාදන ක්‍රියාවලියට උපයෝජනය කරන විට, අවසන් වන නමුත් ප්‍රතිජනනය වන සම්පත්
උදා: ඛනිජ සම්පත් **(ලකුණු 04යි)**

(ii)





⋆ ආර්ථික පසුබැසීම යනු යම් ආර්ථිකයක කාර්තු දෙකක් වැනි කෙටි කාලයක් තුළ මූර්ත ජාතික නිමැවුම පහළ යාමයි. මෙහි දී සේවා නියුක්තිය පහළ බසී. ආර්ථිකයක සැබෑ නිෂ්පාදිතය අඩු වේ, නිෂ්පාදන හැකියා මායිමක ලක්ෂ්‍යය තව දුරටත් වම් පසට ගමන් කරයි.

⋆ ආර්ථික අවපාතය යනු මූර්ත ජාතික නිමැවුමෙහි දිගු කාලීනව සිදු වන සංකෝචනයකි. තීව්‍රතාවයෙන් වැඩි ය. ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම පසු බෑමකට ලක්විය හැකි නිසා සමාහාර ඉල්ලුම පමණක් නොව සමාහාර සැපයුම ද පසුබෑමට ලක් වනු ඇත. මෙහි දී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. **(ලකුණු 04යි)**

(iii)(අ) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ ලා තීරණ සම්බන්ධිකරණ යාන්ත්‍රණය
- වෙළෙඳපොළ ආර්ථික පද්ධති
- විධාන (මධ්‍යගත සැලසුම්) ආර්ථික පද්ධති
- සම්ප්‍රදායික ආර්ථික පද්ධති **(ලකුණු 02යි)**

(ආ) සම්පත් හිමිකාරීත්වය
ධනේෂ්වර ආර්ථික පද්ධති
සමාජවාදි ආර්ථික පද්ධති **(ලකුණු 01යි)**

(ඉ) සානුබල පද්ධතිය
- වෙළෙඳපොළ ආර්ථික පද්ධති
- විධාන (මධ්‍යගත සැලසුම්) ආර්ථික පද්ධති
- සම්ප්‍රදායික ආර්ථික පද්ධති **(ලකුණු 01යි)**

(iv) ⋆ සංඥා සැපයීම - පාරිභෝගිකයින් නිෂ්පාදකයින්ට හා සාධක හිමියන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම

⋆ සානුබල සැපයීම - තීරණ ගන්නා කණ්ඩායම් දිරිගැන්වීමට උත්තේජනයන් ලබා දීම

⋆ සලාකනය - ආර්ථිකයේ හිඟ සම්පත් විකල්ප අරමුණු අතර බෙදා හැරීම

(මුළු ලකුණු 04යි, කරුණු 3 පමණක් නම් ලකුණු 02යි)

(v) සමාජයීය වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් යනු වෙළෙඳපොළ ආර්ථිකය සමග සමාජ සාධාරණත්වය හා පෞද්ගලික නිදහස ඒකාබද්ධ කොටගෙන ක්‍රියාත්මක වන ආර්ථිකයකි. මෙහි සමාජ ශුභ සාධනය ඉතා වැදගත් වේ. පහළ ආදායම් උපයන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටත්, සමාජයේ සියලු දෙනා ම ආර්ථික දුෂ්කරතාවයන්ගෙන් හා අවදානම්වලින් අරක්‍ෂා කර ගැනීමත් අරමුණ වේ.

උදා: ජර්මනිය ඇතුළු ස්කැන්ඩිනේවියානු රටවල් **(පැහැදිලි කිරීමට ලකුණු 03යි)**

(උදාහරණයට ලකුණු 01යි)

2. (i) භාණ්ඩය හෝ සේවාව සඳහා වුවමනාවක් පැවතීම
මිලදී ගැනීමේ හැකියාවක් පැවතීම (ක්‍රය ශක්තිය)
මිලදී ගැනීමේ සැලැස්මක් පැවතීම **(එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 01යි)**

(ii) (අ) 1. යෙදවුම්වල මිල
2. සම්බන්ධිත භාණ්ඩවල මිල
3. තාක්‍ෂණය
4. රජයේ ප්‍රතිපත්ති (බදු හා සහනාධාර)
5. නිෂ්පාදකයින්ගේ අපේක්‍ෂණ
6. නිෂ්පාදකයින් සංඛ්‍යාව **(එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 02යි)**

(ආ) 1. වැඩි වන ආවස්ථික පිරිවැය නීතිය (නිෂ්පාදනය සමග ආන්තික පිරිවැය ඉහළ යාම)
2. මිල වෙනස් වීම සමඟ ලාභාන්තිකය වෙනස් වීම

(එක් කරුණකට ලකුණු 2 බැගින් ලකුණු 02යි)

(iii) අවම මිල නියම කොට මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
සහතික මිලක් ලබා දෙන බවට එකඟ වී, ඌණපූරන ගෙවීම් කිරිම.

(ලකුණු 1 බැගින් ලකුණු 02යි)

ඌණපූරණ ගෙවීම් ක්‍රමයක ආර්ථික ප්‍රතිවිපාක
1. නිෂ්පාදක අතිරික්තය ඉහළ යෑම
2. පරිභෝගික අතිරික්තය ඉහළ යෑම
3. අහිම්වන සමාජ ශුභසාධනයක් ඇති වීම
4. රජයට වියදමක් දැරීමට සිදු වීම
5. ව්‍යාපාරික අයභාරය වෙනස් වීම / පාරිභෝගික පැහැදම වෙනස් වීම
6. පාරිභෝගිකයා ගෙවන මිල පහළ යාම
7. නිෂ්පාදකයාට ලැබෙන මිල ඉහළ යාම

මිල ආධාරක වැඩ පිළිවෙළක ආර්ථික ප්‍රතිවිපාක
1. නිෂ්පාදන අතිරික්තය වැඩිවීම
2. පාරිභෝගික අතිරික්තය අඩු වීම
3. පරිභෝගිකයා ගෙවන මිල ඉහළ යාම / නිෂ්පාදකයාට ලැබෙන මිල ඉහළ යාම
4. ඌණ පූරණ ගෙවීම් ක්‍රමයේ දී ට වඩා අහිමි වන සමාජ ශුභ සාධනය ඉහළ අගයක් ගැනීම

(ඕනෑම ප්‍රතිවිපාක 3කට ලකුණු 03යි)

(iv)



පාරිභෝගික අතිරික්තය $= \frac{(P_1 - 50)\,800}{2}$

$32\,000 = (P_1 - 50)\,400$

$32\,000 = 400P_1 - 20\,000$

$\frac{52\,000}{400} = \frac{400P_1}{400}$

$P_1 = 130$

නිෂ්පාදක අතිරික්තය $= \frac{(50 - P_2)\,800}{2}$

$16\,000 = (50 - P_2)\,400$

$16\,000 = 20\,000 - 400P_2$

$\frac{400P_2}{400} = \frac{4\,000}{400}$

$P_2 = 10$

(නිවැරදි රූප සටහනට ලකුණු 04යි)

(අ) • පාරිභෝගික අතිරික්තය : (130 - 58) × 720/2
= 72 × 360 = 25 920 (ලකුණු 01යි)

• නිෂ්පාදක අතිරික්තය : (46 - 10) × 720/2
= 36 × 360 = 12960 (ලකුණු 01යි)

(ආ) • රජයේ බදු ආදායම = බද්ද × අලෙවි ප්‍රමාණය
= 12 × 720 = 8 640 (ලකුණු 01යි)

(ඉ) • අධි බදු බර = බද්ද × සමතුලිත ප්‍රමාණයේ වෙනස /2
= 12 × (800 - 720)/2
= 12 × 80 /2
= 480 (ලකුණු 01යි)

3. (i) නිෂ්පාදන ක්‍රියාවලියක අවම වශයෙන් එක් යෙදවුමක් වත් ස්ථාවර ව පවතින කාලය කෙටි කාලය යි. ඒ අනුව කෙටි කාලය වශයෙන් සලකන අවධියේ දී ස්ථාවර යෙදවුම් හා විචල්‍ය යෙදවුම් වශයෙන් යෙදවුම් වර්ග දෙකක් පවතින අතර, නිමවුම වෙනස් වීමත් සමග ස්ථාවර යෙදවුම් නොවෙනස් ව පවතී. (ලකුණු 02යි)

ආයතනයක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා සියලු ම යෙදවුම් වෙනස් කිරීමට ප්‍රමාණවත් කාලය දිගු කාලය යි.

දිගු කාලය වශයෙන් සලකන අවධියේ දී ස්ථාවර හා විචල්‍ය වශයෙන් යෙදවුම් වර්ග කිරීමක් නොමැති අතර සියලු ම යෙදවුම් විචල්‍ය යෙදවුම් බවට පත් වේ. (ලකුණු 02යි)

(ii) ව්‍යාපාර ආයතනයක මුළු අයභාරයෙන් මූල්‍ය පිරිවැය හෙවත් ඍජු පිරිවැය අඩු කළ පසු ශේෂය ගණකාධිකරණ ලාභය ලෙස හඳුන්වයි. (ලකුණු 01යි)

ව්‍යාපාර ආයතනයක මුළු අයභාරයෙන් නිෂ්පාදන ක්‍රියාවලියේ මුළු ආවස්ථික පිරිවැය අඩු කළ පසු ශේෂය ආර්ථික ලාභය ලෙස හඳුන්වයි. නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය තුළ ඍජු පිරිවැය හා ආරෝපිත පිරිවැය යන දෙක ම ඇතුළත් වේ. (ලකුණු 01යි)

ආරෝපිත පිරිවැය පවතින විට ගණකාධිකරණ ලාභයට වඩා ආර්ථික ලාභය අඩු අගයක් ගනී. (ලකුණු 01යි)

උදා : ව්‍යාපාර ආයතනයක මුළු අයභාරය = රු. 750 000

පිටතින් මිල දී ගත් යෙදවුම් (ඍජු පිරිවැය) = රු. 300 000

ගණකාධිකරණ ලාභය = රු. 450 000

ආරෝපිත පිරිවැය (අහිමි වූ පොලිය + අහිමි වූ වැටුප් +,

ප්‍රාමාණික ලාභ + ආර්ථික ක්ෂයවීම්) = රු. 200 000

ආර්ථික ලාභය = රු. 250 000 (ලකුණු 01යි)

(iii) **සමානකම්**

1. පූර්ණ තරගයෙහි හා ඒකාධිකාරී තරගයෙහි ආයතන සංඛ්‍යාව විශාල වීම.
2. පූර්ණ තරගයෙහි හා ඒකාධිකාරී තරගයෙහි අබාධ ප්‍රවේශයක් හා පිටවුමක් පැවතීම.
3. පූර්ණ තරගය හා ඒකාධිකාරී තරග ආයතන දිගු කාලය තුළ ප්‍රාමාණික ලාභ පමණක් ලැබීම.

(ලකුණු 02යි)

අසමානකම්

1. පූර්ණ තරගයෙහි සමජාතිය භාණ්ඩ පැවතීම හා ඒකාධිකාරී තරගයෙහි ප්‍රභේදිත භාණ්ඩ පැවතීම.
2. පූර්ණ තරගයෙහි තොරතුරු පූර්ණ වශයෙන් හා පිරිවැයකින් තොරව ලබා ගත හැකි වීම හා ඒකාධිකාරී තරගයෙහි තොරතුරු පූර්ණ වශයෙන් හා පිරිවැයකින් තොරව ලබා ගත නොහැකි වීම.
3. පූර්ණ තරග ආයතයක් මිල ගණුවෙකු වීම හා ඒකාධිකාරී තරග ආයතනයක් මිල තීරකයකු විම.
4. පූර්ණ තරග ආයතනයක ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වන අතර, ඒකාධිකාරී තරග ආයතනයේ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වීම (ලකුණු 02යි)

(iv)කිසියම් වෘත්තියකට හෝ කර්මාන්තයකට ප්‍රවේශ වීම සඳහා පවතින ස්වභාවික හෝ නීතිමය බාධාවන් ප්‍රවේශයට පවතින බාධාවන් ලෙස හඳුන්වයි. කිසියම් වෙළෙඳපොළකට ප්‍රවේශ වීම සඳහා පවතින ප්‍රධාන බාධාවන් වන්නේ,

- ප්‍රධාන අමුද්‍රව්‍ය සහ තාක්ෂණික දැනුම පිළිබඳ හිමිකම එක් ආයතනයක් සතු වීම.
- රජයේ නීතිමය බාධක. (රජයේ බලපත්‍ර, ස්වාධිකාර අයිතිය, වැනි බාධාවන්)
- පරිමාණානුකූල පිරිමැසුම්. එක් ආයතනයකට හිමි වීම නිසා නව ආයතනවලට කර්මාන්තයට ප්‍රවේශ වීමට බාධා ඇති වීම. (ලකුණු 04යි)

(v) (අ) රු. 40කට වඩා වැඩි විය යුතු ය. P = 40 නම් ඉපයිය හැක්කේ ප්‍රාමාණික ලාභ පමණි.

(ලකුණු 01යි)

(ආ)මුළු ස්ථාවර පිරිවැය = සාමාන්‍ය ස්ථාවර පිරිවැය × නිමවුම් පිරිවැය

$$TFC = AFC \times Q$$

$$TFC = (ATC - AVC) \times Q$$

$$TFC = (60 - 40) \times 400$$

$$TFC = 20 \times 400$$

TFC = රු. 8000 (ලකුණු 02යි)

(ඉ) නිෂ්පාදනයෙන් ඉවත් වීමට තිරණය කළ යුත්තේ භාණ්ඩ ඒකකයක මිල රු. 20කට වඩා අඩු වන්නේ නම් ය. කර්මාන්තය තුළ රැඳී සිටීම සඳහා මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයටවත් සමාන විය යුතු ය.

(ලකුණු 01යි)

4. (i) (අ) ශුද්ධ දේශීය ආදායම= දළ දේශීය නිෂ්පාදිතය (වෙ.මි.) - (ශුද්ධ වක්‍ර බදු + ප්‍රාග්ධන ක්ෂය)

= 6000 - (100 + 600)

= 5300 (ලකුණු 02යි)

(ආ) දළ දේශීය වියදම = දළ දේශීය නිෂ්පාදිතය (වෙ.මි.) - ශුද්ධ අපනයන

= 6000 - (-400)

= 6400 (ලකුණු 02යි)

(ඉ) දළ ආයෝජනය = දළ දේශීය වියදම - සමස්ත පරිභෝජනය

= 6400 - 3000

= 3400 (ලකුණු 02යි)

(ඊ) ජාතික ඉතුරුම් = වැයකළ හැකි ජාතික ආදායම - සමස්ත පරිභෝජනය

= 6000 + (-200 + 300) - 3000

= 6000 + 100 - 3000

= 3100 (ලකුණු 02යි)

(ii)
1. ආර්ථිකය තුළ සිදුවන සියලු ම ඵලදායි ක්‍රියා ජාතික ගිණුම් තුළ පිළිබිඹු නොවීම (ගෘහණියගේ සේවා, සමහර යැපුම් ආර්ථික කටයුතු)
2. නොවිධිමත් ආර්ථික කටයුතු (වාර්තා නිවැරදි ව ලබා ගැනීමට අපහසු වීම) යථා පරිදි ඇතුළත් නොවීම
3. විවේකීව සිටීම වැනි පරිභෝජනයන් ජාතික නිෂ්පාදිතය තුළට ප්‍රවේශ නොවීම
4. නිෂ්පාදන ක්‍රියාවලියේ දී පාරිසරික සම්පත්වලට සිදු වන ක්ෂය වීම හා පරිසර දූෂණය සැලකිල්ලට නොගැනීම
5. රජය ණය සඳහා ගෙවනු ලබන සමස්ත පොලිය ම ඵලදායී ආදායමක් වශයෙන් නොසැලකීම (ලකුණු 03යි)

(iii)



(ලකුණු 02යි)

නිමැවුම් ප්‍රවාහය තුළින් ආදායම් ප්‍රවාහයත්, ආදායම් ප්‍රවාහය තුළින් වියදම් ප්‍රවාහයත් හටගනී. නිමැවුම් ප්‍රවාහයේ වටිනාකම ආදායම් ප්‍රවාහයේ වටිනාකමටත්, ආදායම් ප්‍රවාහයේ වටිනාකම වියදම් ප්‍රවාහයටත් වියදම් ප්‍රවාහයේ වටිනාකම නිමැවුම් ප්‍රවාහයේ වටිනාකමටත් අන්‍යෝන්‍ය වශයෙන් සාම්‍ය වීම.

(ලකුණු 02යි)

(iv) රජයේ සියලු ම වියදම් ජාතික ගිණුම් තුළ ඇතුළත් නො වේ එනම් රජයේ සංක්‍රාම වියදම් හා රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම්, ජාතික ගිණුම් තුළ ඇතුළත් නො වේ. (ලකුණු 02යි)

(v) - උද්ධමන පීඩනයකින් තොරව ආර්ථිකයකට නිපදවිය හැකි උපරිම තිරසාර නිමැවුම් මට්ටම විභව නිමැවුම හෝ විභව දළ දේශීය නිෂ්පාදිතය ලෙස හඳුන්වයි. විභව නිමැවුම උපරිම නිමැවුම නොවන අතර, තිරසාර ලෙස පවත්වාගෙන යා හැකි උපරිම නිමැවුම් මට්ටම වේ.

- නිමැවුම් පරතරය යනු සැබෑ නිමැවුම හා විභව නිමැවුම අතර වෙනස යි. එහි ප්‍රභේද දෙකකි.

- ඍණ නිමැවුම් පරතරය (ප්‍රතිගමනාත්මක පරතරය) :- සැබෑ නිමැවුම < විභව නිමැවුම් මට්ටම
- ධනාත්මක නිමැවුම් පරතරය (ප්‍රසාරණාත්මක පරතරය) :- සැබෑ නිමැවුම > විභව නිමැවුම් මට්ටම

(ලකුණු 03යි)

5. (i)
- ★ කුටුම්භ සතු ධනය (වත්කම් තොග)
- ★ කුටුම්භවල අපේක්ෂණ
- ★ කුටුම්භ විසින් ගනු ලබන ණය
- ★ මිල මට්ටම / අපේක්ෂිත උද්ධමනය

(ඕනෑම කරුණු 2කට ලකුණු 02යි)

(ii) $Y = E$

$Y = C + I + G + (X - M)$

$W = J$

$S + T + M = I + G + X$ (Y = E හා W = J පමණක් දක්වා ඇත්නම් ලකුණු නොලැබේ.)

(ලකුණු 02යි)

කිසියම් ආර්ථිකයක ඉතුරුම්, බදු හා ආනයන කාන්දුවීම් වේ. මේවා කාන්දු වීම් ලෙස සලකන්නේ ආදායම් ප්‍රවාහයෙන් වියදම් ප්‍රවාහයට එකතු නොවී බැහැරට ගලා යන නිසා ය. මේවා නිසා සමාහාර ඉල්ලුම අඩු වේ. ආර්ථිකය සංකෝචනය කරයි.

(නම් කිරීමට ලකුණු 01යි)

(පැහැදිලි කිරීමට ලකුණු 01යි)

(iii) (අ) $S = -1000 + 0.2\ yd$

$C = 1000 + 0.8\ yd$

$C = 1000 + 0.8\ (y - T)$

$C = 1000 + 0.8\ (y - 100)$

$C = 1000 + 0.8y - 80$

$C = 920 + 0.8y$ (ලකුණු 01යි)

$C = 920 + 0.8 \times 5000$

C = රු.මිලි. 4920යි. (ලකුණු 01යි)

(ආ) $Y = C + I + G$

$Y = 920 + 0.8y + 200 + 80$

$Y = 1200 + 0.8y$

$Y - 0.8y = 1200$

$Y = 1200 / 0.2$

Y = රු.මිලි. 6000යි. (ලකුණු 02යි)

(ඇ) $APC = c / y$

$APC = 5720 / 6000$

$APC = 0.95$ (ලකුණු 01යි)

$APS = S / y$

$= 180 / 6000$

$= 0.03$ (ලකුණු 01යි)

$S = -1000 + 0.2yd$

$= -1000 + 0.2 (y-t)$

$= -1000 + 0.2(y-100)$

$= -1000 + 0.2y - 20$

$= \underline{-1020 + 0.2y}$

$S = -1020 + 0.2(6000)$

$= -1020 + 1200$

$= 180$

(ඉ) $K = 1 / 1 - b$

$K = 1 / 1 - 0.8$

$K = 1 / 0.2$

$K = 5$ (ලකුණු 02යි)

$\Delta Y = \Delta G \times K$

$100 = 20 \times 5$

සමතුලිත ජාතික ආදායම = 6000 + 100 = රු.මිලි. 6100යි. (ලකුණු 02යි)

(iv)



(රූප සටහනට ලකුණු 02යි)

ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම yf වේ. එම නිමැවුම පවත්වාගෙන යාමට අවශ්‍ය සමාහාර ඉල්ලුම E_F වේ. නමුත් ආර්ථිකයේ සැබෑ සමාහාර ඉල්ලුම E_1 බැවින්, ආර්ථිකය විභව නිමැවුම් මට්ටමට පහළ Y1 නිමැවුම් මට්ටම යටතේ සමතුලිත වේ. ඒ අනුව ආර්ථිකයේ (Y_1-Y_F) ප්‍රතිගමනාත්මක පරතරයක් හට ගනී. Y1 නිමැවුම් මට්ටම නිෂ්පාදන හැකියා මායිමට වම් පසින් පිහිටි නිමැවුම් මට්ටමකි.

(පැහැදිලි කිරීමට ලකුණු 02යි)

6. (i) ● මුදල් යනු පූර්ණ ද්‍රවශීල වත්කම් ය. එනම් විනිමය මාධ්‍යයක් ලෙස ජනතාව පොදුවේ පිළිගන්නා මාධ්‍යයන් ය.

● මුදල් ආදේශක යනු, තාවකාලික හුවමාරු මාධ්‍යයක් ලෙස භාවිත කළ හැකි එහෙත් වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටු නොකරන වත්කම් වේ. උදා : ණයපත්, හරපත්

● ආසන්න මුදල් යනු, හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා නොකරන එහෙත් වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියාකරන වත්කම් වේ.
උදා : ඉතුරුම් හා කාලීන තැන්පතු, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු

● කළු මුදල් යනු ඉපයූ ආකාරය හෙළි කළ නොහැකි මුදල් වේ. මේවා සංසරණ ප්‍රවාහයෙන් බැහැර වී අකර්මන්‍ය මුදල් ශේෂ ලෙස පවතී. (ලකුණු 01 බැගින් ලකුණු 04යි)

(ii)



(රූප සටහන අනිවාර්ය නොවේ.)

- සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට පවතින ඉල්ලුම පොලී අනුපාතයේ සෘණ ශ්‍රිතයකි. මේ නිසා මුදල් ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ. (ලකුණු 01යි)

- පොලී අනුපාතිකය හා සමපේක්ෂණ මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින්නේ
  - ● පොලී අනුපාතය වෙනස් වීම මත මුදල් ලඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය වෙනස් වීම
  - ● පොලී අනුපාතය වෙනස් වන විට අපේක්ෂණ බලපෑම මත පිළිණ පත් මිලට ගැනීම හෝ විකිණීම, යන හේතු නිසා ය. (ඕනෑම කරුණකට ලකුණු 01යි)

(iii) (අ) M_1 = 500 + 1700 = 2200 (ලකුණු 01යි)
M_2 = 2200 + 600 = 2800 (ලකුණු 01යි)
M_{2b} = 2800 + 200 + 500 = 3500 (ලකුණු 01යි)

(ආ) පදනම් මුදල් = 500 + 300 + 200 = 1000
පුළුල් මුදල් සැපයුමේ ගුණකය = 2800 / 1000 = 2.8 (ලකුණු 01යි)

(iv) (අ) - වාණිජ බැංකු අධි සංචිත පවත්වා ගැනීම
- බැංකු ක්‍රමයෙන් පිටතට මුදල් ගලා යාම
- මහජනයාගේ ණය ඉල්ලුම
- මහ බැංකුවේ නීති රීති (ඕනෑම කරුණු 02කට ලකුණු 02යි)

(ආ)

	ජාතික පාරිභෝගික මිල දර්ශකය	කොළඹ පාරිභෝගික දර්ශකය
• පාද වර්ෂය	2013 = 100	2006/07 = 100
• භූගෝලීය ආවරණය	ශ්‍රී ලංකාවේ සියලු ම පළාත්	කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ම නාගරික කුටුම්භ
• ඉලක්ක කෙරුණු කුටුම්භ ඒකක	එක් එක් දිස්ත්‍රික්කයේ සියලු ම කුටුම්භ	කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ම නාගරික කුටුම්භ
• අයිතම සංඛ්‍යාව	407	373
• බර තැබීම	(මත්පැන්, මත්ද්‍රව්‍ය, සිගරට් ඇතුළත් කෙරේ.)	(මත්පැන්, මත්ද්‍රව්‍ය, සිගරට් ඇතුළත් නොකෙරේ.)
- ආහාර	44.04%	41.03%
- ආහාර නොවන	55.96%	58.97%
• මිල එකතු කරන මධ්‍යස්ථාන සංඛ්‍යාව	සෑම දිස්ත්‍රික්කයක ම මධ්‍යස්ථාන 03 බැගින්	කොළඹ නාගරික ප්‍රදේශය තුළ මධ්‍යස්ථාන 14කි.

(ලකුණු 04යි)

(v) (අ) තොග මිල දර්ශකය වෙනුවට වර්තමානයේ හඳුන්වා දී ඇති මිල දර්ශකය වන්නේ, නිෂ්පාදකයින්ගේ මිල දර්ශකයයි. (ලකුණු 01යි)

මෙහි වැදගත්කම නම්,

- වෙළෙඳ පොළ මිල ගණන්වල සිදුවන විචලනයන් මේ මගින් පෙන්නුම් කරන අතර, එම ප්‍රවණතා උපයෝගී කර ගනිමින් වඩා නිවැරදි තීරණ ගැනීමට හැකියාව ලැබේ.
- මෙම දර්ශකය ඵලදායිතා විශ්ලේෂණයට මෙන්ම කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා අගය තීරණය කිරීමට, ව්‍යාපාර තොරතුරු විශ්ලේෂණය හා ස්ථාවර වත්කම් වල වර්තමානයේ පවතින මිල ගණනය කිරීම සඳහා ද භාවිත කෙරේ.
- දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ගණනය කිරීමට වඩා යථානුරූපී මිල දර්ශකයක් සපයා දීම (ඕනෑම කරුණු 02කට ලකුණු 02යි)

7. (i) සමාජයේ යහපත සඳහා කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීමට වෙළෙඳ පොළ යාන්ත්‍රණය අපොහොසත් වීම වෙළෙඳ පොළ අසමත් වීම ලෙස හඳුන්වයි.

වෙළෙඳ පොළ අසමත් වීමට බලපාන හේතු පහත දැක්වේ. (ලකුණු 01යි)

- ★ පොදු භාණ්ඩ නොසැපයීම
- ★ බාහිරතා හට ගැනීම
- ★ අපූර්ණ තොරතුරු
- ★ අපූර්ණ තරගය
- ★ පොදු සම්පත් අධිභාවිතය
- ★ සාධක අසංචලතාවය
- ★ සාධාරණ ආදායම් ව්‍යාප්තියක් නොමැති වීම (ඕනෑම කරුණු 03කට ලකුණු 03යි)

(ii) • නිෂ්පාදනයේ ඍණ බාහිරතා පවතින විට
• පරිභෝජනයේ ඍණ බාහිරතා පවතින විට

නිෂ්පාදන ක්‍රියාවලියක බාහිර පිරිවැයක් පවතින විට එම බාහිර පිරිවැය නිෂ්පාදනයේ පෞද්ගලික පිරිවැයට ගැළපූ පසු සමාජ ආන්තික පිරිවැය, පෞද්ගලික ආන්තික පිරිවැය ඉක්මවයි. එබැවින් වෙළෙඳ පොළ තුළ නිෂ්පාදනය කරන ප්‍රමාණය, සමාජය සම්බන්ධයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම ඉක්මවා යයි. (ලකුණු 02යි)





(රූප සටහන් දෙකෙන් එකකට ලකුණු 02යි)

(iii) නීත්‍යානුකූලව බදු ගෙවිය යුතු තැනැත්තා බදු ගෙවන මොහොතේ දී දරණ බදු ආපාතය, ව්‍යවස්ථාපිත බදු ආපාතය වේ.

උදා: දුම්වැටි නිෂ්පාදකයා විසින් නිපදවන දුම්වැටියක් සඳහා රු. 20ක බදු මුදලක් ගෙවන අවස්ථාවේ දී නිෂ්පාදකයාගේ මුදල් ආදායම කෙරෙහි ඇතිවන තාවකාලික බලපෑමයි.

බදු විතැන් කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ බදු ගෙවන්නා ගේ මූර්ත ආදායම කෙරේ ඇති වන බලපෑම ආර්ථික බදු ආපාතයයි.

ඉහත උදාහරණයට අනුව දුම්වැටිය මත රු. 20ක බද්දක් පැන වූ පසු දුම්වැටියක මිල රු. 12කින් ඉහළ ගියේ නම්, නිෂ්පාදකයාගේ මූර්ත ආදායම කෙරේ සැබෑ වශයෙන් ඇති වන බලපෑම රු. 8ක් වේ. එය සැබෑ බදු බර ලෙස හඳුන්වයි.

ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය අතර වෙනසක් හට ගන්නේ බදු විතැන් කිරීමේ ක්‍රියාවලිය මතය. බදු විතැන් කිරීමේ හැකියාව බදු පනවන භාණ්ඩයේ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව මත රඳා පවතී.

(ලකුණු 04යි)

(iv) රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

1978	2013	2014	2015
27.4	14.5	11.4	13

(ලකුණු 02යි)

පසුගිය දශක 4ක් තුළ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සැළකිය යුතු අන්දමින් පහළ ගොස් ඇති අතර, රාජ්‍ය ආදායම පහළ යාමට පහත සඳහන් හේතු බලපා ඇත.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස,

- බදු ආදායම අඩු වීම.
  - නිර්බාධ වෙළෙඳාමට ප්‍රවේශ වීම.
  - මෑත කාලීන බදු ප්‍රතිසංස්කරණවල පවත්නා දුර්වලතා.
  - බදු පරිපාලනය දුෂ්කර වීම. මේ නිසාම බදු පැහැර හැරීම ඉහළ ගොස් ඇත.
  - 2002 වැට් බද්ද හඳුන්වා දුන් පසුව විවිධ භාණ්ඩ සඳහා ලබා දී ඇති බදු සහන සංඛ්‍යාව 500ට වැඩි ය.
  - ආදායම් හා සමාගම් බදු සම්බන්ධව ද විවිධ සහන 40 ට වඩා ඇත. ඊට අමතරව BOI ආයෝජකයන්ට අතිරේක බදු සහන සපයයි.
  - අන්තර් ජාලයෙන් භාණ්ඩ මිලදී ගැනීම.
  - බදු ක්‍රමයේ සංකීර්ණත්වය.
- රාජ්‍ය ව්‍යවසායන් ගේ ආදායම් පහළ යාම. (ලකුණු 02යි)

(v) (අ) රජයේ මුළු ආදායමින් (බදු හා බදු නොවන ආදායම්) පුනරාවර්තන වියදම අඩු කළ විට ලැබෙන වටිනාකම වර්තන ගිණුමේ ශේෂය ලෙස හැඳින් වේ. (ලකුණු 01යි)

(ආ) රජයේ ආදායම් හා ප්‍රදානවලින් රාජ්‍ය ණය සඳහා පොළී හැර අනෙකුත් රාජ්‍ය වියදම් අඩු කළ පසු ලැබෙන අගය ප්‍රාථමික ගිණුමේ ශේෂය වේ. (ලකුණු 01යි)

(ඉ) රජයේ ආදායම් හා ප්‍රදානවලින් රජයේ ණය ආපසු ගෙවීම් හැර අනෙකුත් රජයේ වියදම් අඩු කළ පසු ලැබෙන වටිනාකම ශුද්ධ මූල්‍ය හිඟය ලෙස හඳුන්වනු ලබයි. (ලකුණු 01යි)

(ඊ) යම් අමාත්‍යාංශයකට විසර්ජන පනතින් වෙන් කර දෙන ලද මුදල් අයවැය වර්ෂය අවසාන වීමට පෙරාතුව වැය වුවහොත්, ඉතිරි කාලයට අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කර ගැනිම සඳහා අමාත්‍යාංශය භාර ඇමතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වැය ඇස්තමේන්තුව පරිපූරක ඇස්තමේන්තුව ලෙස හඳුන්වයි. (ලකුණු 01යි)

8. (i)
- නිෂ්පාදන සාධක හිමිකාරිත්වයේ ස්වභාවය
- නිෂ්පාදන ශිල්ප ක්‍රමය (තාක්ෂණය)
- ජාත්‍යන්තර විශේෂීකරණය
- අදාළ නිෂ්පාදන ක්‍රියාවලියේ පරමාණානුකූල ඵල
- රටේ විශාලත්වය හා රටේ පිහිටීම
- කර්මාන්තයේ ආරම්භක තත්ත්වය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- වෙළෙඳ පොළ තරගකාරිත්වය
- නිෂ්පාදන ක්‍රියාවලියේ භාණ්ඩ ප්‍රභේදනය
- නිෂ්පාදන අභිරුචිය (ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)

(ii) මෙම ප්‍රකාශය හා එකඟවිය හැක.

ශ්‍රී ලංකාවේ අපනයන නැඹුරුව යුරෝපා රටවල් හා ඇමරිකා එක්සත් ජනපදය දෙසට දිශා ගත වී ඇත.

උදා : 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයන දිශාව පහත දැක්වේ.

රට	මුළු අපනයන වල දායකත්වය (%) (2015)
ඇමෙරිකා එක්සත් ජනපදය	27
එක්සත් රාජධානිය	11
යුරෝපා සංගමය	12

එමෙන්ම ශ්‍රී ලංකාවේ ආනයන නැඹුරුව ආසියාතික රටවල් වෙත දිශා ගත වී ඇත.

උදා : 2015 වසරේ ශ්‍රී ලංකාවේ ආනයන දිශාව පහත දැක්වේ.

රට	මුළු ආනයන වල දායකත්වය (%) (2015)
ඉන්දියාව	23
චීනය	20
සිංගප්පූරුව	6
ජපානය	7

(iii) (අ) වෙළෙඳ ගිණුමේ ශේෂය = අපනයන - ආනයන
= 1200 - 1800
= -600 (ලකුණු 01යි)

(ආ) සේවා ගිණුමේ ශේෂය = රක්ෂණ (ශුද්ධ) + සංචාරක (ශුද්ධ) + ප්‍රවාහන (ශුද්ධ) + මූල්‍ය සේවා (ශුද්ධ)
= (30 - 20) + (60 - 10) + (140 - 120) + (25 - 15)
= 10 + 50 + 20 + 10
= 90 (ලකුණු 01යි)

(ඉ) ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = ශුද්ධ පොලිය හා ලාභ + සේවක වැටුප් (ශුද්ධ)
= (5 - 25) + (7 - 12)
= (- 20) + (-5)
= - 25 (ලකුණු 01යි)

(ඊ) ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය = සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ (ශුද්ධ)
= (300 - 80)
= 220 (ලකුණු 01යි)

(iv)කළමනාකරණය කළ නම්‍ය විනිමය අනුපාතය හෙවත් පාලිත නම්‍ය විනිමය අනුපාතය වූ කලී ස්ථාවර විනිමය අනුපාතිකය හා නම්‍ය විනිමය අනුපාතිකය යන ක්‍රම දෙකෙහි දක්නට ඇති යහපත් ලක්ෂණවලින් වාසි ලබා ගැනීම සඳහා ගනු ලැබූ එම ක්‍රම දෙකෙහි ම සංකලනයකි.

මෙහි දී මූල්‍ය අධිකාරීන් විසින් දේශීය මුදල් ඒකකය සඳහා ස්ථාවර විනිමය අනුපාතිකයක් තීරණය කොට, එය එක්තරා පරාසයක් තුළ දෝලනය වීමට ඉඩ හරිනු ලැබේ.

පරාසය ඉක්මවා විනිමය අනුපාතය වෙනස් වීමට නැඹුරු වන විට, විනිමය අනුපාතිකයේ ක්ෂය වීම හා අගය ඉහළ යාම වැළැක්වීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳ පොළ තුළ දේශීය මුදල් විකිණීමේ හා මිලදී ගැනීමේ යෙදෙමින් විනිමය අනුපාතිකයේ දෝලනයන් පාලනය කෙරේ.

මෙම ක්‍රමය යටතේ වෙළෙඳපොළ බලවේග තුළින් විනිමය අනුපාතිකය නිදහසේ තීරණය වීමට ඉඩ නොහැර, විනිමය අනුපාතිකයේ දෝලනයන් පාලනය කිරීමට මහ බැංකුව විදේශීය විනිමය වෙළෙඳපොළට මැදිහත්වීම් කරන බැවින්, එය පිරිසිදු පාවීමක් නොව අපිරිසිදු පාවීමක් ලෙස ද හැඳින්වේ.

පාලිත නම්‍ය විනිමය අනුපාත ක්‍රමය යටතේ කෙටි කාලයේ දී විනිමය අනුපාතිකයේ උච්ඡාවචන පාලනය කිරීමට විනිමය වෙළෙඳපොළට මැදිහත් වීම් කරන අතර, දිගු කාලයේ ද වෙළෙඳ පොළ බලවේග විසින් විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හැරේ.

(ලකුණු 04යි)

(v) ආරක්ෂණවාදය යනු, දේශීය ළදරු කර්මාන්ත විදේශීය තරගකාරී ආනයනයන්ගෙන් ආරක්ෂා කර ගැනීමයි. ආරක්ෂණවාදයට එරෙහි ව ලෝක වෙළෙඳ සංවිධානය බිහි වී ඇත. එමගින් රටවල් විසින් තීරුබදු හා තීරු බදු නොවන වෙළෙඳ බාධක අනුගමනය කිරීමට බාධා කරමින් ලෝක වෙළෙඳාම වඩාත් විවෘත කිරීමට කටයුතු කරනු ලබයි. මෙහි දී ලෝක වෙළෙඳ සංවිධානය පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කරනු ඇත.

(ලකුණු 02යි)

- වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමට සාකච්ඡා කිරීම.
- ගිවිසුම් ක්‍රියාවට නැංවීම හා ඒවා අධීක්ෂණය කිරීම.
- වෙළෙඳ ආරවුල් බේරුම් කිරීම.
- සාමාජික රටවල වෙළෙඳ ධාරිතාව වැඩි දියුණු කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම.
- රටවලට තාක්ෂණික ආධාර සැපයීම. (ඕනෑම 02කට ලකුණු 02යි)

9 (i) ඉහළ ආර්ථික වෘද්ධි වේගයක් අපේක්ෂා කරන අර්ථිකයක් විසින් ඒ සඳහා පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරගත යුතුය.

- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම.
- ආර්ථිකයේ ඉතුරුම් හා ආයෝජනය ඉහළ මට්ටමක පවත්වා ගැනීම.
- පොළී අනුපාත පහළ මට්ටමක පවත්වා ගැනීම.
- බදු අනුපාතය සරල කිරීම.
- විදේශ ආයෝජන දිරි ගැන්වීම.
- සම්පත් සම්භාරය ඉහළ නංවා ගැනීම.
- තාක්ෂණය වැඩි දියුණු කර ගැනීම.
- මානව නිපුණතා වර්ධනය කිරීම.
- යහ පාලනය. (ඕනෑම කරුණු 04 කට ලකුණු 04යි)

(ii) ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ

- ඉහළ මට්ටමේ ජීවන තත්වයක් අත්කර ගත හැකි වීම.
- සේවා නියුක්තිය ඉහළ යාම
- රාජ්‍ය මූල්‍ය කෙරෙහි හිතකර ලෙස බලපෑම
- ව්‍යාපාරික විශ්වසනීයත්වය වර්ධනය වීම
- ජනතාව පෙරට වඩා වැඩි අවස්ථා උදා වීම. (කරුණු 02කට ලකුණු 02යි)

ආර්ථික වෘද්ධියේ පිරිවැය

- පාරිසරික හායනය
- උද්ධමනකාරී තත්වයක් ඇති වීම
- ආදායම් ව්‍යාප්ති විෂමතා හට ගැනීම
- වර්තමාන පරිභෝජන මට්ටම පහළ යාම (කරුණු 02කට ලකුණු 02යි)

(iii)සංවර්ධනය යනු බහුමාන ක්‍රියාවලියකි. ආදායම් ඉහළ යාම, ජීවන තත්වය උසස් වීම, ඉහළ මට්ටමේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය, සාරවත් සංස්කෘතික ජීවිතය, පුද්ගල නිදහස තහවුරු වීම ආදී අවශ්‍යතා සම්පූර්ණ වීම සංවර්ධනය නම් වේ. මින් පෙනී යන්නේ ආර්ථික වෘද්ධියක් තිබීම පමණක් සංවර්ධනය ලෙස සැලකිය නොහැකි බවයි. (ලකුණු 02යි)

ඉහත කී සියලු තත්වයන් ළඟා කර ගැනීම සඳහා අවශ්‍යයෙන් ම ඉහළ මට්ටමේ ආදායමක් හිමි කර ගත යුතු වේ. එවැනි ආදායම් මට්ටමක් හිමි කර ගත හැක්කේ ඉහළ ම ආර්ථික වෘද්ධියක් ළඟාකර ගැනීමෙනි. ආර්ථික වෘද්ධිය සමඟ සේවා නියුක්ති අවස්ථා ඉහළ යාමත්, ආදායම් මට්ටම ඉහළ යාමත් සිදුවේ. එබැවින් සංවර්ධනය සඳහා ආර්ථික වෘද්ධිය පූර්ව කොන්දේසියක් වේ.

(ලකුණු 02යි)

(iv) ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය කැපී පෙනෙන ලක්ෂණ තුනක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.

- ඉතා ඉහළ දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය හා ඊට සමගාමීව පහළ ජනගහන වර්ධන අනුපාතිකයක් සහිත අයහපත් තත්ත්වයක සිට ඉතා පහළ දළ උපත් අනුපාතිකයක්, දළ මරණ අනුපාතිකයක් හා පහළ ජනගහන වර්ධන අනුපාතිකයක් සහිත යහපත් තත්ත්වයකට මාරුවීම.

- ජනගහනයේ වයස් ව්‍යුහය පිරමිඩාකාර ස්වරූපයක සිට සිලින්ඩරාකාර ස්වරූපයකට මාරු වීම.

- ඉතා ඉහළ යැපුම් අනුපාත තත්ත්වයක සිට ස්වරූපය වෙනස් වූ සාමාන්‍ය යැපුම් අනුපාතිකයක් වෙත මාරු වීම. (ලකුණු 02යි)

එහි ප්‍රතිවිපාක ලෙස පහත කරුණු ඉදිරිපත් කළ හැක.

- ජන විකාශ පාරිතෝෂික / ප්‍රතිලාභ තත්ත්වයක් නිර්මාණය වී ඇති අතර වැඩ කරන වයස් සීමාව අවුරුදු 60 ලෙස ගතහොත් එම ප්‍රතිලාභය 2017 වසර දක්වා පවතිනු ඇත.

- එම ප්‍රතිලාභ වනුයේ
  - කුටුම්භ ඉතුරුම් ශක්තිමත් වීම.
  - රජයේ ශුභ සාධන වියදම් පහළ යාම නිසා රාජ්‍ය මූල්‍ය ගැටලුවලට යම් විසඳුමක් වීම.
  - පෞද්ගලික හා රාජ්‍ය ඉතුරුම් ආයෝජනය සඳහා යෙදවිය හැකිවීම.
  - ආර්ථික වෘද්ධි අපේක්ෂා ඉහළ යාම.

- කෙසේ වෙතත් මෙම ප්‍රතිලාභ කාල සීමාව ඉක්මවීමෙන් පසු වයස්ගත යැපුම් අනුපාතය ඉහළ යාම නිසා වැඩ කරන වයසේ ජනගහනය අඩුවීම, ශුභ සාධන වියදම් ඉහළ යාම හා වැඩිහිටියන් අනාරක්ෂිත වීම ආදී ගැටලු සහිත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවනු ඇත.

- ස්ත්‍රී ආයු අපේක්ෂාව පුරුෂ ආයු අපේක්ෂාව ඉක්මවා යාම නිසා වියපත් ස්ත්‍රී සංඛ්‍යාව වැඩිවීම සමඟ ස්ත්‍රී යැපෙන්නන් සංඛ්‍යාව ඉහළ යාම හා ඔවුන් අනාරක්ෂිත භාවයට පත්වීම.

(v) පසුගිය දශක තුන තුළ ශ්‍රී ලංකාවේ සමස්ත දරිද්‍රතා මට්ටමෙහි පහළ යාමක් පෙන්නුම් කරන අතර ප්‍රාදේශීය වශයෙන් හා ආංශික වශයෙන් දරිද්‍රතාව තවමත් විෂමතා පවත

උදාහරණ : ජනගහන දරිද්‍රතා දර්ශකය වෙනස් වූ ආකාරය

අංශය	1995/96	2002	2006/7	2009/10	2012/13
ශ්‍රී ලංකාව	28.8	22.7	15.2	8.9	6.7
නාගරික	14.0	7.9	6.7	5.3	2.1
ග්‍රාමීය	30.9	24.7	15.7	9.4	7.6
වතු	38.4	30.0	32.0	11.4	10.9

පළාත් වශයෙන් ගත් විට අවම දරිද්‍රතා මට්ටම වූ 2.0% බස්නාහිර පළාතෙන් වාර්තා වූ අතර ඉහළ ම දරිද්‍රතා මට්ටම වූ 15.4% ඌව පළාතෙන් වාර්තා විය.

දිස්ත්‍රික් මට්ටමින් සළකා බැලීමේදී කොළඹ දිස්ත්‍රික්කයේ දරිද්‍රතාව 1.4% ද මුලතිව් දිස්ත්‍රික්කයේ 27.8% ද වාර්තා විය.

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්ති විෂමතාව ඉහළ මට්ටමක පැවති අතර එහි තීව්‍රතාව සුළු වශයෙන් අඩු වී ඇත.

ආදායම් පංගු කුටුම්භයන්ගේ දශමක අනුව

වර්ෂය	පහළම ආදායම් ලබන පවුල් 10%ට හිමි ආදායම් ප්‍රතිශතය	ඉහළම ආදායම් ලබන පවුල් 10%ට හිමි ආදායම් ප්‍රතිශතය	කුටුම්භ අනුව ගිනි සංගුණකය
2006/7	1.6	40.1	0.49
2009/10	1.6	39.5	0.49
2012/13	1.5	38.0	0.48

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු වීමට ආදායම් ව්‍යාප්ති විෂමතාවයේ තීව්‍රතාව පහළ යාම යම් හේතුවක් වී ඇතත් රජය විසින් ක්‍රියාත්මක කරන ලද පුළුල් සමාජ ආරක්ෂණ ජාල, දිළිඳු සහන, අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි සමාජ ශුභ සාධන සේවා දරිද්‍රතාවයක් අඩු වීමට ප්‍රබල ලෙස දායක වී ඇති බැව් පෙනේ.

10 (i) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත අපේක්ෂා පහත සඳහන් පරිදි දැක්විය හැක.

- ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව ඉහළ යාම
- ඉහළ, පහළ, මැද යන සෑම මට්ටමක ම සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම.
- ඉහළ මට්ටමේ ඒක පුද්ගල වියදම දරන සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම.

අභියෝග

- සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම
- පුහුණු සේවකයින්ගේ අවශ්‍යතාව සහ ශ්‍රම සංක්‍රමණය
- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම සහ කොළඹ හෝටල් සඳහා පනවා ඇති අවම ගාස්තුව

- සංචාරක ව්‍යාපාරයේ උපාය මාර්ගික අවධානය ඉහළ, මැද සහ පහළ පෙළ සංචාරකයින් වෙත යොමු කිරීම
- අවිධිමත් අංශය අන්තර්ග්‍රහණය කිරීම
- විශාල විභවතාවක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමට ඇති හැකියාව සීමා වීම
- නැවතී සිටින රාත්‍රී සංඛ්‍යාව ලෙස ගණනය කරනු ලබන සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එක ලෙස ම පැවතීම
- නව නිර්මාණාත්මක ප්‍රවේශයක අවශ්‍යතාව (කරුණු 04කට ලකුණු 04යි)

(ii) යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම - වෘත්තීය සමිතිවල බලපෑම්
අක්‍රමවත් විදුලි බල සැපයුම - බදු ක්‍රමයේ සංකීර්ණත්වය
රාජ්‍ය ප්‍රතිපත්ති අස්ථාවර වීම - දැඩි රෙගුලාසිකරණය
දේශපාලන අස්ථාවර භාවය - විදේශ විනිමය සංචලනයන් පිළිබඳ සීමාවන්
(කරුණු 04කට ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික වෘද්ධිය කෙරෙහි ඉහළ ම දායකත්වයක් දක්වා ඇති අංශ පහත සඳහන් පරිදි වේ.

	2015 වසරේ ද.දේ.නි ට දායකත්වය ප්‍රතිශත වශයෙන්
- වෙළෙඳාම, ප්‍රවාහනය හා නවාතැන් සැපයීම	23.2%
- නිෂ්පාදන කර්මාන්ත	15.7%
- මූල්‍ය, රක්ෂණය, නිවාස අයිතිය හා දේපල වෙළෙඳාම්	12.3%
- වෘත්තීමය සේවා හා වෙනත් පෞද්ගලික සේවා	11.8%

(iv)
- විදේශ වෙළෙඳාමේ විශාල පසු බැසීමක් දක්නට ලැබීම
- 2000 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 89%ක් වූ භාණ්ඩ හා සේවා වෙළෙඳාම 2013 වන විට 54%ක් දක්වා පහළ බැස තිබීම
- යුද්ධය නිම වී වසර පහකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණත් සෘජු විදේශ ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් 25%කට වඩා අඩු වීම
- ශ්‍රී ලංකා ගෝලීය වෙළෙඳාමේ තම ප්‍රතිශතය 1980 ගණන්වල පැවති ප්‍රමාණය අඩු කර ගෙන තිබීම
- 2004 දී අපනයන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයෙන් 28%ක් පමණ වූ අතර 2014 දී එය 15%කට වඩා අඩු වීම
- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යූහය තවමත් ඉතා ප්‍රාථමික මට්ටමක පැවතීම.

(v) 2000 වසරේ දී ඉදිරිපත් කළ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථවල දිගුවක් ලෙස 2015 වසරේ දී එක්සත් ජාතීන් විසින් තිරසාර සංවර්ධන අභිමතාර්ථ එළි දක්වා ඇත.

තිරසාර සංවර්ධනයේ පුළුල් ක්ෂේත්‍ර පහකි. එනම්,

- ජනතාව දිළිඳු බවෙන් මුදා ගැනීම
- පෘථිවිය ආරක්ෂා කිරීම
- සෞභාග්‍යය උදා කිරීම
- සාමය ස්ථාපිත කිරීම
- ජගත් හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම

මෙම පුළුල් ක්ෂේත්‍ර ඉටු කර ගැනීම සඳහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17ක් හඳුන්වා දී ඇත.
උදාහරණ :

- සියලු ආකාරයේ දිළිඳුකම දුරැලීම
- කුසගින්න දුරලීම හා ආහාර සුරක්ෂිතතාව සහ තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය
- සෑම දෙනාටම සෞඛ්‍යය සම්පන්න ජීවිතයක් තහවුරු කිරීම

මෙම අභිමතාර්ථ මගින් සාධනය කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක 169කි. 2030 වසර අවසන් වන විට ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කරයි.

The National e-learning Portal for The General Education